**ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූලි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් ලැබීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී, කෘෂි සත්ත්ව හා වෙනත්, සංගීත හා නර්තන, ආරක්ෂක සේවා, ඉදිකිරීම් හා නඩත්තු සේවා යන ආදායම්වලින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සැළකියයුතු ආදායමක් රැස්කරන අතර, සමාලෝචිත වර්ෂයේදීද එම ආදායම් ප්‍රභවයන්ගෙන් එකතුව රු. මිලියන 769.58 ක ආදායමක් රැස්කර තිබුණි. වාර්ෂිකව උපයනු ලබන මෙම ආදායම් ගිණුම්ගත කිරීමට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විමසා වෙනම ආදායම් ශීර්ෂයක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව විසින් වෙනම ආදායම් ශීර්ෂයක් ඉල්ලීම්කර ඒ සඳහා සිහිකැඳවීම්ද යොමු කර ඇති බව. | දෙපාර්තමේන්තු වට වෙනම ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට කටයුතු කළයුතු වීම. |

### 1.6.2 දේපළ පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් යන්ත්‍ර සහ උපකරණ යටතේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණු වර්ෂ අවසාන ශේෂයේ එකතුව රු. මිලියන 914.14 ක් වූ අතර, එම වත්කම්වලට අදාළව විගණනයට ලබාදී ඇති තොරතුරු අනුව වර්ෂ අවසාන ශේෂය රු.මිලියන 112.1 ක් වූයෙන් රු. මිලියන 802.04 ක වෙනසක් පැවතුණි. | සිගාස් පරිගණක වැඩසටහනේ ස්ථාවර වත්කම් ලේඛනයේ ශේෂය හා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරන ලද ශේෂය සමානුපාතිකවන බව. | අදාළ වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළයුතු වීම. |

### 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ලබාගෙන ඇති ණය හා අත්තිකාරම් වෙනුවෙන් සීසී-10 ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, පරිගණක පැතුරුම්පත් ආධාරයෙන් ණයශේෂ සහ අයකිරීම් සටහන් කර තිබුණි. | 2022 වර්ෂයේ සිට සීසී - 10 ණය හා අත්තිකාරම් ලේඛන ආරම්භ කර, යාවත්කාලීන කර පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සී.සී.- 10 ආකෘතිය හා ඒ ආකෘතිය පදනම් කරගෙන ණය හා අත්තිකාරම් ලේඛන පිළියෙල කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදේශීය ගමන් වියදම් සඳහා වැය විෂය 320-1-01-1102 යටතේ සලසාගෙන තිබුණු රු. මිලියන 1.5 ක ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරිකර තිබුණි. | පැවති ලෝක වසංගත තත්ත්වය නිසා විදේශ ගමන් සීමාවීමෙන් මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී ඇති බව. | මු.රෙ.50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළයුතු වීම. |
| (ආ) | මූලධන වැය විෂයයන් පහක් සඳහා එකතුව රු. මිලියන 246.5 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.මිලියන 100.55 ක ප්‍රතිපාදන ද, පුනරාවර්තන වැය විෂයයන් 17 ක් සඳහා එකතුව රු. බිලියන 6.89 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු. බිලියන 1.41 ක ප්‍රතිපාදන ද, උපයෝජනය කර නොතිබුණි. එම ඉතිරිකිරීම් ප්‍රමාණය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 සිට සියයට 83 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය මත භාණ්ඩ හා සේවා ලබාගැනීම සඳහා නිසිපරිදි ඇණවුම ලබාදිය නොහැකිවීම හා ඩොලරයේ ඇති වූ බලපෑම මත සැපයුම්කරුවන් අධෛර්යමත්වීම වැනි තත්ත්වයන් මත මෙම ඉතිරිවීම් සිදුවී ඇති බව. | - එම - |
| (ඇ) | පුනරාවර්තන වැය විෂයන් හතරක සහ මූලධන වැය විෂයක සලසා තිබුණු ප්‍රතිපාදන අතිරික්ත වීම නිසා මු.රෙ. 66 යටතේ පිළිවෙලින් රු. මිලියන 106 ක් සහ රු. මිලියන 11 ක් වෙනත් වැය විෂයන්වලට මාරුකරගෙන තිබුණි. | ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය පරිදි ප්‍රතිපාදන ලබා නොදීම නිසා වියදම් කළමනාකරණය කිරීම සඳහා මෙලෙස ප්‍රතිපාදන මාරුකර ගැනීමට සිදුවූ බව. | - එම - |
| (ඈ) | පුනරාවර්ථන වැය විෂයක් හා මූලධන වැය විෂයක් සඳහා මු.රෙ 66 යටතේ පිළිවෙලින් මාරු කරගෙන තිබුණු රු. මිලියන 4 ක හා රු. මිලියන 72 ක සම්පූර්ණ ප්‍රතිපාදන වර්ෂ අවසානයට ඉතිරිකර තිබුණි. තවද, මු.රෙ. 66 යටතේ මූලධන වැය විෂයක්ද ඇතුළුව වැය විෂයන් 03 ක් සඳහා එකතුව රු. මිලියන 41 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණු අතර, මෙම මාරු කරගත් ප්‍රතිපාදන වලින් එකතුව රු. මිලියන 13 ක් හෙවත් සියයට 32 ක් වර්ෂ අවසානයට ඉතිරිකර තිබුණි. | කොරෝනා තත්ත්වය නිසා භාණ්ඩ ආනයනයේදී ඇතිවූ ගැටලු, පුද්ගලික හා රාජ්‍ය ආයතන වසා දැමීම, තැපැල් හා ප්‍රවාහන කටයුතු අඩාලවීම වැනි තත්ත්වයන් හේතුවෙන් මෙම ඉතිරිවීම් සිදුවී ඇති බව. | - එම - |

**2.2** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවලින් රු. මිලියන 140.16 ක බැරකම් අනාවරණය කර නොතිබුණි. | මෙම බැරකම් වටිනාකම වර්ෂ අවසාන බැදීම් වටිනාකම තුළ අන්තර්ගතකර ඇති බව. | මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදි බැරකම් වටිනාකම් අනාවරණය කළයුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළව වැය විෂයයන් 15 කට අයත් රු. මිලියන 142.69 ක බැරකම් 2022 මාර්තු 31 දින වනවිටත් බේරුම් කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත්ව තිබුණි. | කොරෝනා අවදානම හේතුවෙන් සැපයුම්කරුවන් විසින් කලට වේලාවට බිල්පත් ඉදිරිපත් නොකිරීම මෙම තත්ත්වයට හේතුවී ඇති බව. | කඩිනමින් බැරකම් බේරුම් කිරීමට කටයුතු කළයුතු වීම. |
| (ඇ) | මු.රෙ 94(1) හා 214 රෙගුලාසි නොසළකා කටයුතු කිරීම නිසා මසකට වඩා ප්‍රමාද වූ බැරකම් අයිතම 51 ක් වූ අතර, එහි වටිනාකම රු. මිලියන 2.1 ක් විය. | - එම - | - එම - |

**2.3** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

**විගණන නිරීක්ෂණය**

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | මුදල් රෙගුලාසි 104(3) (4) | දෙපාර්තමේන්තුවේ වාහනයකට සිදුවූ රිය අනතුරකට අදාළව ප්‍රාරම්භක හෝ පරිපූර්ණ වාර්තා ඉදිරිපත්කර නොතිබුණි. | පෙන්වාදී ඇති පරිදි කටයුතු කිරීමට අවශ්‍ය අභ්‍යන්තර පාලනයක් ස්ථාපිතකර ඇති බව. | අදාළ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |
| (ii) | මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ රු. 569,311 ක් වටිනා චෙක්පත් 39 ක් සම්බන්ධයෙන් අදාළ රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ සැපයුම්කරුවන් වෙත එම චෙක්පත් නිෂ්කාශනය කර ගන්නා ලෙස දන්වා ඇති බව. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 770(4) හා<br><br>770 (අ) (ආ) | පෙර වර්ෂවල ධාවනයෙන් ඉවත්කර ඇති වාහන 25 ක් පැවතුණු අතර, 2020 වර්ෂයට පෙර ධාවනයෙන් ඉවත්කර ඇති වාහන ද ඒ අතර, පැවතුණි. තවද, සමාලෝචිත වර්ෂයේ ධාවනයෙන් ඉවත්කළ වාහනයක් ධාවනයට අයෝග්‍ය බවට තීරණයකර තිබුණු අතර, මෙම වාහන අපහරණය කිරීමට කටයුතුකර නොතිබුණි. | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබීමෙන් පසු අදාළ රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව. | - එම - |
| ( iv) | මුදල් රෙගුලාසි 880 හා 891 | දෙපාර්තමේන්තුවේ ඇප තැබියයුතු විධායක තනතුරු 06 කට සහ ද්විතීක තනතුරු 03 කට අදාළ නිලධාරීන් ඇප තබා නොතිබුණි. | අදාළ නිලධාරීන්ගෙන් ඇප තැන්පත්කර ගැනීමට කටයුතු කරනු ලබන බව. | - එම - |
| (v) | මුදල් රෙගුලාසි 1645 (අ) | දෙපාර්තමේන්තුවේ වාහන 17 කට අදාළව ලොග් සටහන් පොත් පවත්වා තිබුණද, අත්‍යාවශ්‍ය තොරතුරු යාවත්කාලීනව වාර්තාකර නොතිබුණි. | අදාළ ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන යාමට ප්‍රවාහන අංශ වෙත උපදෙස් ලබා දී ඇති බව. | - එම - |
| (vi) | මුදල් රෙගුලාසි 1647 (ඉ) | දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන ගිය වාහන ලේඛනයේ එක් එක් වාහනය භාරදුන් දිනය හෝ පැවරූ දිනය සඳහන්කර නොතිබුණි. | අදාළ තොරතුරු ඇතුළත්කර මෙම වාහනවලට අදාළ ලොග් සටහන් පොත් යාවත්කාලීන කිරීමට උපදෙස් ලබාදී ඇති බව . | - එම - |
| (ආ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>---------------- | | | |
| | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | දෙපාර්තමේන්තුව විසින් පරිහරණය කරනු ලබන වාහන 426 කට හා යතුරුපැදි 205 කට අදාළව සමාලෝචිත වර්ෂයේ හෝ පෙර වර්ෂවල ඉන්ධන පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. | වර්තමානයේ පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් මෙම පරීක්ෂාවන් ප්‍රමාද කර ඇති බව. | - එම - |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර වර්ෂවල සේවය හැරගොස් ඇති නිලධාරීන් 220 දෙනෙකුගෙන් අයවිය යුතු රු.මිලියන 13.17 ක අපදා, උත්සව හා විශේෂ අත්තිකාරම් ණය ශේෂවලින් වර්ෂ තුන ඉක්මවා ඇති ණය ශේෂවල වටිනාකම රු.මිලියන 9.4 ක් විය. තවද සමාලෝචිත වර්ෂයේ සේවය හැරගොස් ඇති නිලධාරීන් 75 දෙනෙකුගෙන් අයවිය යුතු රු. මිලියන 3.25 ක උත්සව, ආපදා හා විශේෂ අත්තිකාරම් ණය ශේෂයක් ද පැවති අතර එම ශේෂයන් අයකර ගැනීම දුර්වල මට්ටමක පැවතුණි. තවද, සමලෝචිත වර්ෂයේ සේවය හැරගොස් තිබුණු නිලධාරීන් හතර දෙනෙකුට අදාළ එකතුව රු. 605,466 ක් වූ අයවිය යුතු ආපදා ණය ශේෂ සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයවියයුතු ණය ශේෂ ලෙස ගිණුම් මඟින් හෙළිදරව් කර තිබුණු අතර, සේවය හැරගොස් ඇති නිලධාරියකුගෙන් අයවිය යුතු රු.133,550 ක ණය ශේෂය ගිණුම්වලින් මඟහැරී තිබුණි. | මෙම ණය ශේෂ අයකර ගැනීමට හෝ කපාහැරීමට මණ්ඩලයක් පත්කර ඇති අතර ඉදිරියේදී එම මණ්ඩල වාර්තාව අනුව ක්‍රියාකිරීමට සැලසුම් කර ඇති බව. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.3 වගන්තියේ දැක්වෙන විධිවිධාන අනුව මෙම ණය ශේෂ කඩිනමින් අයකර ගතයුතු වීම සහ අයවියයුතු ණය ශේෂ නිවැරදිව ගිණුම් මඟින් හෙළිදරව් කළයුතු වීම. |
| (ආ) | විශ්‍රාමගිය නිලධාරීන් 12 දෙනෙකුගෙන් හා මියගිය නිලධාරීන් 19 දෙනෙකුගෙන් පිළිවෙලින් අයවිය යුතු රු. මිලියන 2.03 ක හා රු. මිලියන 2.57 ක ආපදා ණය ශේෂ ගිණුම් වලින් මඟහැරී තිබුණු අතර, මෙම ණය ශේෂ පිළිබඳව කාල විශ්ලේෂණයන් ලබාදීමට හෝ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. තවද, ගිණුම මඟින් විශ්‍රාමගිය නිලධාරීන් 37 දෙනෙකුගේ එකතුව රු. 516,260 ක් වූ ආපදා, උත්සව හා විශේෂ අත්තිකාරම් ණය ශේෂ වර්ෂයට අඩු ශේෂ ලෙස දක්වා තිබුණද, වර්ෂය ඉක්මවූ ණය ශේෂද ඒ අතර පැවතුණි. | මෙම හිඟහිටි ණය ශේෂ ඔවුන්ගේ විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට උපදෙස් ලබාදී ඇති බව හා කාල විශ්ලේෂණ නිවැරදිව පිළියෙල කිරීමටත්, ගිණුම්ගතවී නොමැති ණය ශේෂ කඩිනමින් ගිණුම්ගත කිරීමටත් ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2 හා 4.4 වගන්තිවල දැක්වෙන විධිවිධාන පරිදි මෙම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වීම සහ අයවිය යුතු ණය පිළිබඳව නිවැරදි කාල විශ්ලේෂණයන් පවත්වා ගතයුතු වීම. |
| (ඇ) | සේවයේ නියුතු නිලධාරීන් 322 දෙනෙකුගෙන් 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා හිඟහිට තිබුණු රු. මිලියන 10.94 ක ආපදා, උත්සව හා විශේෂ අත්තිකාරම් ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ණය මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව. | අදාළ ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතුවීම. |

**2.5 බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ බැංකු ජංගම ගිණුමක 2020 වර්ෂයේ සිට පැවතුණු එකතුව රු. මිලියන 23.79 ක හඳුනානොගත් ලැබීම් ශේෂය හඳුනාගෙන නිසිපරිදි ගිණුම්ගත කරනු වෙනුවට තැන්පත් ගිණුමකට මාරුකර තිබුණි. | තවදුරටත් හඳුනාගතයුතු මෙම ශේෂය හඳුනාගෙන ගිණුම්ගත කිරීමට පියවර ගනු ලබන බව. | අදාළ ශේෂ හඳුනාගෙන කඩිනමින් නිසිපරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු වීම. |

**2.6 අවිධිමත් ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ සේවය කර, සමාලෝචිත වර්ෂයේ හා ඊට පෙර වර්ෂවල සේවය හැරගිය, විශ්‍රාමගිය හෝ මියගිය නිලධාරින් 442 දෙනෙකුට ඔවුන් තවදුරටත් සේවයේ නියුතු වූවන් ලෙස සලකා එකතුව රු. මිලියන 10.08 ක් වැටුප් ලෙස ගෙවා තිබුණු අතර, මෙම ගෙවීම්වලින් රු. මිලියන 2.36 ක් පමණක් ආපසු අයකර ගෙන තිබුණි. | තවදුරටත් අයකර ගතයුතු වැඩිපුර ගෙවූ මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව. | වැටුප් ගෙවීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළයුතු වීම හා වැඩිපුර ගෙවනලද වැටුප් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතු වීම. |

**2.7 වංචනික ස්වරූපයේ ගණුදෙනු**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගණුදෙනුවක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ කතරගම බලකා මූලස්ථානයේ පළල අඩි 16 ක් හා දිග අඩි 903 ක් වන ප්‍රධාන අභ්‍යන්තර මාර්ග පද්ධතිය කොන්ක්‍රීට් අතුරා නවීකරණය කිරීම සඳහා ප්‍රදේශයේ පුද්ගලික ආයතනයකින් සිමෙන්ති, ගල්, වැලි ඇතුලු ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීමේ බිල්පත්‍රයකට රු.584,200 ක් ගෙවා තිබුණු අතර, අදාළ ඉදිකිරීම් ද්‍රව්‍ය මේවන තෙක් කතරගම බලකා මූලස්ථානයට ලැබී නොමැති අතර, එම මාර්ගයේ අලුත්වැඩියාවද සිදුකර නොතිබුණි. | මේ සම්බන්ධව විමර්ශන කටයුත්තක් කරගෙන යනු ලබන බව හා පරීක්ෂණ අවසානයේ ඉදිරි පියවර ගන්නා බව. | ප්‍රසම්පාදන කටයුතු හා වවුචර් සඳහා ගෙවීම් කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළයුතු වීම හා අදාළ වංචනික ගණුදෙනුවලට සම්බන්ධ පාර්ශවවලට විනය පියවරගෙන අයකරගැනීම් කළයුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

--------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් මන්නාරම කොණ්ඩච්චි ප්‍රදේශයේ අක්කර 1,200 ක පමණ කජු ගස් 27,000 කට ආසන්න කජු වගා ව්‍යාපෘතියක් දීර්ඝ කාලයක සිට පවත්වාගෙන යනු ලබන අතර, පසුගිය වර්ෂ 5 ක ආදායම හා වියදම සැසඳීමේදී රු.මිලියන 10.6 ක ආදායම ඉක්මවූ වියදමක් පැවතුණි. තවද, මේ සඳහා යොදවා ඇති සිවිල් ආරක්ෂක භටයින් 180 දෙනෙකුගේ වැටුප් වියදම සැලකිල්ලට ගතහොත් ව්‍යාපෘතියේ අලාභය තවදුරටත් ඉහළයන බව නිරීක්ෂණය විය. වන අලි තර්ජනය නිසා ආරක්ෂාවට පමණක් භටයින් 120 දෙනෙකු යොදවා තිබුණු අතර, කජු ගස් 14,700 ක් පමණක් අංක කර ලේඛන ගතකර තිබුණි. තවද, කජු එලදාව නෙලීම හා ලේඛනගත කිරීම විධිමත් අධීක්ෂණයකින් තොරව සිදු කරන අතර, කජු අස්වැන්න ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම් සපයා නොතිබුණි. | ඉදිරියේදී භූමියවටා අලිවැටක් ඉදිකිරීමටත්, අංක නොකළ කජු ගස් අංක කිරීමටත්, අස්වනු නෙලීම නිසි ලෙස අධීක්ෂණය කිරීමටත්, ප්‍රමාණවත් ගබඩා පහසුකම් ලබාදීමටත් කටයුතු කරන බව. | වගාව, අස්වනු නෙලීම හා ගබඩා කිරීම නිසි ලෙස කළමනාකරණය කරමින් වියදම් අවම කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළයුතු වීම. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

-----------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව රාජ්‍ය ආයතන 350 කට ආරක්ෂාව සැලසීමට සැලසුම්කර තිබුණද, රාජ්‍ය ආයතන 99 කට පමණක් ආරක්ෂාව සලසා තිබුණු අතර, ඒ අනුව භෞතික ප්‍රගතිය සියයට 28 කට සීමා වී තිබුණි. තවද, පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කිරීම, ඩෙංගු මර්ධනය, කොරෝනා පාලනය, පොලිස් රාජකාරී සඳහා සහායදීම සහ නගර අලංකරණය යන ව්‍යාපෘතිවල ඉලක්කයන් ප්‍රමාණාත්මකව ක්‍රියාකාරී සැලැස්මේ දක්වා නොතිබුණි. | 2021 වර්ෂයේ දී ආයතන 101 කට අදාළව ස්ථාන 617 ක් සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීමට සැලසුම්කර තිබූ අතර, ඒ අනුව අපේක්ෂිත ස්ථානයන් වෙත සේවා සම්පාදනයන් සිදුකර ඇති බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කයන් ප්‍රමාණාත්මකව දැක්විය යුතුවීම හා අදාළ ඉලක්කගත සැලසුම්කරා ලඟාවීමට කටයුතු කළයුතු වීම. |

### 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

-----------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍ය දැක්ම සංකල්පයට අනුව කෘෂි වගාව නගාසිටුවීමේ අරමුණින් | විගණන නිරීක්ෂණ හා එකඟවන බව හා මේවන විට අක්කර 20 පිළිබඳව සැලසුම් සකස් නොකර නියමු | ව්‍යාපෘති ආරම්භ කිරීම නිසි ශක්‍යතා අධ්‍යනයකින් පසුව |

| | | |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ කැබිතිගොල්ලෑව බලකායට අදාළව අක්කර 20 ක භූමි ප්‍රමාණයක හරිතාගාර (Green House) මිරිස් වගා ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීමට රු. මිලියන 17.67 ක් ද ඇතුලුව, එකතුව රු. මිලියන 18.37 ක මුදලක් වැයකර තිබුණු අතර, නිසි ශක්‍යතා අධ්‍යනයකින් තොරව මෙම වියදම් දැරීම නිසා ව්‍යාපෘතිය මෙතෙක් ආරම්භ කිරීමට හෝ නොහැකිව අසාර්ථක වී තිබුණි. | ව්‍යාපෘතියක් ලෙස මෙම ලබාගෙන ඇති අයිතම උපරිම අයුරින් ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි මිරිස් වගා ව්‍යාපෘතිය අක්කර 04 ක භූමි භාගයක ක්‍රියාත්මක කිරීමට කටයුතු ආරම්භ කර ඇති බව. තවද, මෙවැනි ව්‍යාපෘති ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමේදී නිසිපරිදි සැලසුම් කර ශක්‍යතා අධ්‍යනයකින් පසුව ආරම්භ කිරීමට කටයුතු කරනු ලබන බව. | සිදුකළ යුතු වීම. |

## 3.4 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගත් ව්‍යාපෘති

---------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම සිවිල් ආරක්ෂක භටයින් යොදවා ක්‍රියාත්මකකර තිබුණු ව්‍යාපෘතිවලින් විගණන නියැදි පරීක්ෂාවක් ලෙස කතරගම, මොණරාගල, අම්පාර, උහන හා මහඔය බලකා මඟින් ක්‍රියාත්මක කරනු ලබන ඉදල්, ඉරටු, මල් පෝච්චි, ගඩොල්, දියර කිරි, පත්තර කවර, මැහුම්, කොසු, විසිතුරු මසුන්, මැටි භාණ්ඩ, රස කැවිලි හා දුම් කරවල යන ව්‍යාපෘති පරීක්ෂා කළ අතර, අදාළ ව්‍යාපෘතිවලින් මෙම කාලපරිච්ඡේදය තුල වියදම ඉක්මවා රු. මිලියන 8 ක ආදායමක් වාර්තා කර ඇතත්, අදාළ ව්‍යාපෘති සඳහා යොදවා ඇති භට පිරිස්වල වැටුප් පිරිවැය සළකා බැලුවහොත් ලබා තිබුණු ආදායම ඉක්මවූ වියදම රු. මිලියන 76.5 ක් වී තිබුණි. අදාළ ව්‍යාපෘති සඳහා අමුද්‍රව්‍ය ලබාගත් බිල්පත්/ලේඛන මෙන්ම නිෂ්පාදිතයන් අලෙවි කිරීමෙන් ලද ආදායම් ලේඛනද නොතිබුණු නිසා සත්‍ය නිෂ්පාදනයක් සිදුවී තිබේද යන්න හෝ අදාළ ව්‍යාපෘති සත්‍ය වශයෙන් ක්‍රියාත්මක කර තිබේද යන්නද ගැටලු සහගත විය. තවද, වැටුප් පිරිවැය සලකා බැලීමේදී බොහෝමයක් ව්‍යාපෘති පිරිවැය අතින් ඵලදායී නොවන බැවින්, ඵලදායී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂිත අරමුණුවලට ළඟාවීමට ඇති හැකියාව පිළිබඳව ඉහළ කළමණාකාරීත්වයේ අවධානය යොමුවී නොතිබුණි. | අසාර්ථක ව්‍යාපෘති ගණනාවක් වර්තමානය වන විට අවසන් කර ඊට වඩා ඵලදායී ව්‍යාපෘතිවල යොදවා ඇති බව. | ව්‍යාපෘතිවල පිරිවැය ඵලදායකත්වය පිළිබඳව අවධානය යොමුකළ යුතුවීම සහ අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළයුතු වීම. |

**3.5 ප්‍රසම්පාදනයන්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර තුනක කාලයක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මෙහි රු. මිලියන 167 ක් වැයකර ප්‍රසම්පාදනය කර ගන්නා භාණ්ඩ හෝ සේවා ඒකක ප්‍රමාණයන් දක්වා නොතිබුණි. | මින් ඉදිරියේදී ත්‍රෛයිවාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරනු ලබන බව හා සියලු වැය ශීර්ෂයන්ට අදාළ භණ්ඩ හා උපකරණ වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කිරීම ප්‍රායෝගිකව සිදුකළ නොහැකි බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව සැලසුම් සකස් කළයුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය හා සීමිත/පාලිත ජාතික තරගකාරී ලංසු ක්‍රමයන් අනුගමනය කරමින් සිදුකර තිබුණු රු. මිලියන 65 ක ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පොදුවේ අනාවරණය වූ කරුණු පහත දැක්වේ. | | |
| (i) | ආයතන 200 කට අධික ප්‍රමාණයකගෙන් මිල ගණන් ඉල්ලා තිබුණද, ලැබී තිබුණු මිල ගණන් සංඛ්‍යාව 10 කට අඩු ප්‍රමාණයක පැවතුණු අතර, මිල ගණන් ඉල්ලීම් ලේඛන ලංසුකරුවන්ට යැවූ බවට තැපැල් කුවිතාන්සි හෝ විද්‍යුත් පණිවිඩ සනාථන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | වර්තමානයේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි හා දේදුනු පැහැති පිටු මඟින් සැපයුම්කරුවන් තෝරාගැනීම සිදුකරනු ලබන බව හා විද්‍යුත් තැපැල් ලේඛන අදාළ ලිපි ගොනුවේ බහාලීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | ලංසු ඉල්ලුම් කිරීමේ විකල්ප ක්‍රම සොයා බැලීමටත්, අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමටත් කටයුතු කළයුතු වීම. |
| (ii) | ලංසු ලියාපදිංචි තැපෑලෙන් ලද ඒවාද, ටෙන්ඩර් පෙට්ටියට බහාලු ඒවාද යන්න විගණනයට අනාවරණය නොවුණු අතර, ලියාපදිංචි තැපෑලෙන් ලද ලංසු සම්බන්ධයෙන් ලියාපදිංචි තැපෑල විවෘත කළ ලේඛන හෝ ටෙන්ඩර් පෙට්ටිය විවෘත කිරීමේ ලේඛන පවත්වා නොතිබුණි. | ඉදිරියේදී මෙම ලේඛන පවත්වා ගැනීමට කටයුතු කරනු ලබන බව. | අදාළ ලේඛන පවත්වාගත යුතුවීම. |
| (iii) | ඇතැම් මිලදී ගැනීම් වලදී එක් එක් සැපයුම් කාණ්ඩ සඳහා සැපයුම්කරුවන් විශාල ප්‍රමාණයක් ලියාපදිංචි වී සිටියද ඉතා සීමිත සැපයුම්කරුවන් ප්‍රමාණයකගෙන් මිල ගණන් විමසා තිබුණු අතර, මෙම මිල ගණන් විමසූ සැපයුම්කරුවන් තෝරාගත් පදනමද විගණනයට අනාවරණය නොකෙරුණි. | ඉදිරියේදී මෙම තොරතුරු අනාවරණය කිරීමට කටයුතු කරනු ලබන බව. | ලංසුකරුවන් තෝරාගත් පදනම විගණනයට අනාවරණය කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (iv) | 3.3 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් නිර්නායකයන් නොසලකා ඇතැම් මිලදී ගැනීම් සඳහා සීමිත/පාලිත ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යොදාගෙන තිබුණි. | අදාළ නිර්දේශ සමඟ එකඟ වන අතර ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව වඩාත්ම සුදුසු ප්‍රසම්පාදන ක්‍රමය තෝරාගතයුතු වීම. |
| (v) | තාක්ෂණික ඇගයීම් කමිටු හා ලංසු විවෘත කිරිමේ කමිටු පත්කිරිමේ ලිපි ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදාළ ලේඛන ගොනුගත කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | අදාළ ලේඛන විගණනයට ඉදිරිපත් කළයුතු වීම. |
| (vi) | විවිධ ශක්‍යතාවයන් ඇති භාණ්ඩ හා උපකරණ සඳහා එකම නිලධාරීන් කණ්ඩායමකින් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර තිබුණි. | වෘත්තීය විශේෂඥ දැනුමක් ඇති නිලධාරීන් සීමිත පිරිසක් සිටින බැවින් ඒ සඳහා තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශ ලබා ගැනීමට නිරන්තරයෙන් එම නිලධාරීන් පත්කිරීමට සිදුවී ඇති බව. | 2.8.1 (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව විෂය පිළිබඳ විශේෂඥයෙකුගෙන් සහ ප්‍රසම්පාදන කාර්යපටිපාටි පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති අවම වශයෙන් එක් නිලධාරියෙකුගෙන් තාක්ෂණික ඇගයීම් කමිටු සමන්විත විය යුතු වීම. |
| (vii) | 6.3.3 (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු විවෘත කිරීම විනිවිදභාවයකින් යුක්තව ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරිපිටදී සිදුකර නොතිබුණි. | අදාළ නිර්දේශ සමඟ එකඟ වන අතර ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතුකළයුතු වීම. |
| (ඇ) | එක් එක් ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් නිරීක්ෂණය කරන කරුණු පහත දැක්වේ. | | |
| (i) | ලිපිගොනු 11 යටතේ රු.මිලියන 17.67 ක් වැයකර හරිතාගාර (Green House) මිරිස් වගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩ හා උපකරණ ප්‍රසම්පාදනයේදී ලංසු විවෘත කිරීම්, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයන් ලබාදීම්, ප්‍රසම්පාදන කමිටු තීරණ ලබාදීම් හා භාණ්ඩ ඇණවුම් කිරීම් වැනි ප්‍රසම්පාදන කටයුතුවලට පෙර ගබඩාවට භාණ්ඩ ලැබී තිබුණු අතර, විගණනය නොමඟ යැවීම සඳහා මිලදී ගැනීමෙන් පසු ඒවා නිත්‍යානුකූල බවට තහවුරු කිරීමට ලිපි ලේඛන සකස්කර තිබුණි. ඉතා ඉක්මණින් අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදුකර ගැනීමට කටයුතු කිරීම නිසා ප්‍රසම්පාදන ලිපිගොනු හතරක් යටතේ රු. මිලියන 3. 23 ක මුදලක් වැඩිපුර වැයකර මිලදී ගත් භාණ්ඩ හා උපකරණ නිශ්කාර්යව වර්ෂයකට අධික | අතිගරු ජනාධිපතිතුමන්ගේ උපදෙස් පරිදි අදාළ ව්‍යාපෘතිය ඉතා කඩිනමින් ආරම්භ කිරීමට උපදෙස් ලබා දී තිබූ බැවින් නිලධාරීන් විසින් ඒ සඳහා කටයුතු කර තිබේ. මෙම පිළිවෙත නිවැරදි නොවන බව පිළිගන්නා අතර, වර්තමානයේ හෝ අනාගතයේ එසේ සිදු නොවීමට ක්‍රියාකරන බව හා කොරෝනා ව්‍යාප්තිය නිසා බොහෝ ව්‍යාපාර ස්ථාන විවෘතව නොතිබූ බැවින් ක්ෂේත්‍ර පරීක්ෂාවන් මඟින් වෙළඳපල මිල විමර්ෂණය කර අවම මිල ගණන් ඉදිරිපත් කළ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කරමින් රජයට වඩා වාසි සහගත ලෙස ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කාලයක් ගබඩාකර තිබුණු අතර, මේ නිසා වර්ෂයක පමණක් වගකීම් කාලයක් ඇති යන්ත්‍ර සහ විදුලි උපකරණවල නිදහස් වගකීම් කාලය සම්පූර්ණයෙන් නිශ්කාර්යව උපයෝජනය වී තිබුණි. මිල සැදහුම් ක්‍රමය යටතේ මිලදී ගැනීමේදී, ලබා ගතයුතු අවම මිල ගණන් ප්‍රමාණය ලබාගෙන නොතිබුණි. මෙම භාණ්ඩ සහ උපකරණ තොගය යටතේ රු.මිලියන 2.78 ක් වැයකර Rotavator 02 ක් මිලදී ගැනීමේදී ලංසු විවෘත කිරීම එක් සාමාජිකයෙකු විසින් සිදුකර තිබුණු අතර, තාක්ෂණික පිරිවිතරයන්ට අනුකූල අඩු මිල ලංසුකරු ප්‍රතික්ෂේප කර රු.මිලියන 1.98 ක වැඩි මිලකට ප්‍රසම්පාදනය කරගෙන තිබුණි. රු.මිලයන 5 ක් වැයකර Insect Proof Net මිලදී ගැනීමේදී අඩු මිල ගණන් ඉදිරිපත්කළ හා පිරිවිතර අවශ්‍යතා සැපිරූ තායිවාන නිෂ්පාදනයක් හා ඊශ්‍රායලයේ නිෂ්පාදනයක් හේතු නොදන්වා බැහැරකර වැඩි මිල ගණන් යටතේ ප්‍රසම්පාදනයකර තිබුණි. රු. මිලයන 3.75 ක වියදමින් ගොඩනැගිලි ද්‍රව්‍ය හා ස්ප්‍රේ මැෂින් මිලදී ගැනීමේදී කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | සැපයුම්කරුගෙන් භාණ්ඩ ප්‍රසම්පාදනය කරගෙන ඉන් අනතුරුව ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රසම්පාදන අංශය වෙත ලිපි ඉදිරිපත් කර ඇති බව. | |
| (ii) | රු.මිලියන 9.83 ක් වැයකර කළු පොලිතින් කි.ග්‍රෑ 13,000 ක් මිලදී ගැනීමේදී 2.14.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ලබාගත යුතු අවම ලංසු ප්‍රමාණය ලබාගෙන නොතිබුණු අතර, 5.6 මාර්ගෝපදේශය ප්‍රකාරව පිරිවිතර ලේඛනයක් සකස්කර නොතිබුණි. තවද, පොලිතින් පිළිබඳව තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබානොගෙන තත්ත්වයෙන් උසස් බව නිර්දේශකර වැඩි මිල ඉදිරිපත් කළ ලංසුකරුවකුගෙන් රු. මිලියන 4.12 ක අමතර වැයබරක් දරා අදාළ පොලිතීන් තොගය මිලදී ගෙන මාස 05 කට අධික කාලයක් ගතවී ඇතත්, රු. මිලියන 9 ක් වටිනා පොලිතින් කිලෝ ග්‍රෑම් 12862 ක් හෙවත් මුළු තොගයෙන් සියයට 99 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් සැපයුම් ආයතන වසා තිබූ අතර, විවෘතව තිබූ ආයතන වලටද විෂයයන් සැපයුම් කිරීමේ අපහසුතාවයක් පැවැති බැවින් ලැබී තිබූ ලංසු ප්‍රමාණය මත මිලදී ගැනීම් සිදු කරන ලද අතර, කෘෂිකර්මවේදී උපදේශකයෙකු ලබාදුන් ප්‍රමිති සහතිකයක් පිරිවිතරය ලෙස භාවිතා කර ඇති බව හා රට තුළ පවතින අර්බුදකාරී වාතාවරණය හේතුවෙන් ප්‍රවාහන පහසුකම් නොමැති වීම හේතුවෙන් බෙදාහැරීමේ ප්‍රමාදයන් පවතින බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කරමින් රජයට වඩා වාසි සහගත ලෙස ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට කටයුතු කළයුතු වීම සහ අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනීම් කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (iii) | රු.මිලියන 9.38 ක් වැයකර ටයර් 408 ක් , ටියුබ් 345 ක් හා කොලර් 187 ක් මිලදී ගැනීමේදී පිරිවිතර ලේඛනයක් සකස්කර නොතිබුණු අතර, 5.3.1 (ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි ලංසු ලේඛන අනුමතකර නොතිබුණි. තවද, ලංසුකරුවන්ගේ පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා ලේඛන කැඳවා නොතිබුණු අතර, 7.7 (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව ලංසු ලේඛනයේ නිශ්චයකොට දක්වා නොමැති ඇගයීම් සාධක ලංසු ඇගයීමේදී භාවිතාකර පක්ෂපාතීව සැපයුම්කරු තෝරාගෙන තිබුණු අතර, මුළු තොගයම තනි සැපයුම්කරුවෙකුගෙන් මිලදී ගැනීමේ ක්‍රමය වෙනුවට ඒකක අවම මිල ගණන් ඉදිරිපත්කළ සැපයුම්කරුවන් තෝරාගත්තේනම් රජයට රු. 632,378 ක මුදලක් ඉතිරිකරගත හැකිව තිබුණි. | ඉදිරි ප්‍රසම්පාදනයන්වලදී ලංසු ලේඛන අනුමත කිරීමට කටයුතු කරන අතර, අඩුම කාල පරාසයක් ලබාදී ඇති සැපයුම්කරුගේ එම අයිතම ලබාගැනීමට තාක්ෂණික කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කර ඇති බව හා කොවිඩ් උවදුර හේතුවෙන් වෙළඳපොල තුළ ටයර් හිඟයක් පැවතුන බැවින් සැපයුම්කරුවන් කිහිප දෙනෙකුගෙන්වත් මෙම විෂයන් ලබාගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගතවූ නිසා එකම ආයතනයකට ඇණවුම ලබාදී ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළයුතු වීම හා රජයට වඩා වාසිදායක ලෙස ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතුවීම. |
| (iv) | රු.මිලියන 9.54 ක් වැයකර LED Light මිලදී ගැනීමේදී 2.14.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ කාර්ය සංග්‍රහය ප්‍රකාරව ලබාගතයුතු අවම ලංසු ප්‍රමාණය ලබාගෙන නොතිබුණු අතර, 7.7 (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු නොකර ලංසු ලේඛනයේ නිශ්චය කොට දක්වා නොමැති ඇගයීම් සාධක ලංසු ඇගයීමේදී භාවිතාකර පක්ෂපාතීව සැපයුම්කරු තෝරාගෙන තිබීම නිසා රු.මිලියන 3.09 ක වැඩි පිරිවැයක් දරා මිලදී ගැනිමට සිදුවී තිබුණි. | පැවැති කොවිඩ් වසංගතය හේතුවෙන් සැපයුම් ආයතන බොහොමයක් වසාදමා තිබූ හෙයින් තිදෙනෙකු පමණක් මිළ ගණන් ඉදිරිපත් කර ඇති බව හා ඉදිරියේදී 7.7 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළයුතු වීම හා රජයට වඩා වාසිදායක ලෙස ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතුවීම. |
| (v) | රු.මිලියන 6.6 ක් වැයකර පෙරපාසල් ගුරුවරියන් සඳහා සාරි 3999 ක් මිලදී ගැනීමේදී 2.14.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ලබාගතයුතු අවම ලංසු ප්‍රමාණය ලබාගෙන නොතිබුණු අතර, සාරි තොගයේ වගකීම් කාලය මාස 06 ක් වුවද, විගණනයෙන් පරීක්ෂා කරන විට ගබඩාවට ලැබී මාස 07 ක් ගතවූ රු.මිලියන 1.3 ක් වටිනා සාරි 854 ක් පැවති අතර, මෙම තොගවල වගකීම් කාලයද ඉක්මවා මසකට අධික කාලයක් ගතවී ඇතත් බෙදානොහැර නිශ්කාර්යව ගබඩා කර | ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීම සිදුකර ඇති බව හා මේ වනවිට අදාළ සාරි ප්‍රමාණය පෙර පාසැල් ගුරුවරියන් වෙත කඩිනමින් නිකුත්කර අවසන් කිරීමට කටයුතු කරමින් පවතින බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළයුතු වීම හා අවශ්‍යතාවයන් නිසි පරිදි හඳුනාගෙන ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. තවද, ගබඩාවට ලැබී මාස 02 ක් ගතවූ රු. 770,001 ක් වටිනා සාරි 504 ක් ද බෙදාහැර නොතිබුණි. | | |
| (vi) | රු.මිලියන 4.74 ක් වැයකර Toner වර්ග 09 ක් මිලදී ගැනීමේදී, මිලදී ගැනීම් සිදුකිරීමෙන් පසුව ව්‍යාජ ලෙස අදාළ ප්‍රසම්පාදන කමිටු වාර්තා ඇතුළු ලේඛන පිළියෙල කර තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟවන බව. | ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව විනිවිදභාවයකින් යුතුව සිදුකළ යුතුවීම. |
| (vii) | රු.මිලියන 1.99 ක් වැයකර ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීමේදී 2.14.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ කාර්යසංග්‍රහය ප්‍රකාරව ලබාගතයුතු අවම ලංසු ප්‍රමාණය ලබාගෙන නොතිබුණු අතර, ආයතන 10 කින් මිල ගණන් ඉල්ලා ඇතත්, ලැබී තිබුණේ එක් ලංසුවක් පමණක් වීම හේතුවෙන් දෙවනවරට මිල ගණන් කැඳවීමට තීරණය කළද, එම අවස්ථාවේදීද පළමුවරට මිල ගණන් ඉල්ලුම්කළ ආයතන 07 න් මිල ගණන් ඉල්ලුම් කිරීම නිසා එම අවස්ථාවේදීද ලැබී තිබුණු එක් ලංසුවක් මත පදනම්ව තරඟකාරීත්වයෙන් බැහැරව මිලදීගෙන තිබුණි. | ලබාගතයුතු අවම මිල ගණන් සංඛ්‍යාව ලබාගැනීමට නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති බව හා අත්වැරදීමකින් පළමුවරට මිලගණන් ඉල්ලුම්කළ ආයතනවලින් දෙවනවරටත් මිල ගණන් ඉල්ලුම්කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළයුතු වීම හා තරඟකාරී මිල ගණන් ලබාගෙන රජයට වඩා වාසිසහගත ලෙස ප්‍රසම්පාදනයන් සිදුකිරීමට කටයුතු කළයුතු වීම. |
| (viii) | රු.මිලියන 1.73 ක් වැයකර ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීමේදී මිල ගණන් ඉල්ලුම් කිරීම සඳහා නියමිත විෂය කාණ්ඩයේ ලියාපදිංචි සැපයුම්කරුවන් තෝරානොගැනීම නිසා නැවත පිරිවැයක් දරමින් ප්‍රසම්පාදන කටයුතු කිරීමට සිදුව තිබුණු අතර, ඇස්තමේන්තුව සියයට 81 කින් ඉක්මවා තිබුණි. | ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි ඇළුමිනියම් නිෂ්පාදනය කරන ආයතන වලින් මිළ ගණන් කැඳවා ඇති බව හා වර්තමානයේදී වෙළඳපල මිළ ගණන් ඉහළ ගොස් ඇති බැවින් ඇස්තමේන්තුව ඉක්මවා ඇති බව. | සැපයුම්කරුවන් සතුව ප්‍රමාණවත් තොග තිබේද යන්නත් අපේක්ෂිත කාලවකවානුව තුළ සැපයිය හැකිද යන්නත් තහවුරු කරගත යුතුවීම හා ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කළයුතු වීම. |
| (ix) | රු.මිලයන 1.33 ක් වැයකර Band Uniform Caps සහ Leather Gates 241 ක් මිලදී ගැනීමේදී පිරිවිතර ලේඛනයක් සකස්කර නොතිබුණු අතර, 7.7 (ඇ) මාර්ගෝපදේශයට පටහැනිව ලංසු ලේඛනවලින් ඉල්ලා නොතිබුණු “ආදර්ශක” ප්‍රධාන නිර්නායකයක් කරගනිමින් සැපයුම්කරු තෝරාගෙන තිබුණි. | ඉදිරියේදී සිදුකරනු ලබන ප්‍රසම්පාදනවලදී විස්තරාත්මක පිරිවිතරයන් සකස් කිරීමටත් ලංසු ලේඛන වලට ආදර්ශක ලබාදීම සම්බන්ධව ඡේදයක් ඇතුළත් කිරීමටත් උපදෙස් ලබාදී ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |
| (x) | රු.මිලියන 1.14 ක් වැයකර පෝසිලීන් භාණ්ඩ මිලදී ගැනීමේදී මිල ගණන් ඉල්ලා නොමැති ලංසුකරුවකු මිල ගණන් එවා තිබුණු අතර, මිලදී ගැනීමේදී | විගණන නිරීක්ෂණ හා එකඟවන බව හා දෙපාර්තමේන්තු ලාංඡනය මුද්‍රණය කර ඇති, රන්වන් | ඇගයීම් ක්‍රියාවලිය සඳහා අස්ථිත්වය විසින් කැඳවනලද ලංසු පමණක් දායක කරගත යුතුවීම හා |

| | | | |
|---|---|---|---|
| | පිරිවැය ඇස්තමේන්තුව රු. 784,769 කින් හෙවත් සියයට 218 කින් ඉක්මවා තිබුණි. | පාටින් ඉරක් (Gold Line) මුද්‍රණයකර ඇති, පෝසිලේන් භාණ්ඩ මිලදී ගැනීම නිසා ඇස්තමේන්තුව ඉක්මවා ඇති බව. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කළයුතු වීම. |
| (xi) | රු.මිලියන 1.13 ක් වැයකර කෘමිනාශක 200 මි.ලි ඒකක 567 ක් මිලදී ගැනීමේදී ඇස්තමේන්තුව ඉක්මවා සියයට 198 ක් වැයකර තිබුණු අතර, 2.14.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ කාර්යසංග්‍රහය ප්‍රකාරව ලබාගතයුතු අවම ලංසු ප්‍රමාණය ලබාගෙන නොතිබුණි. තවද, 6.3.3 (අ) මාර්ගෝපදේශයෙන් බැහැරව ලංසු විවෘත කිරීමට එක් නිලධාරියෙකු පමණක් සහභාගී වී තිබුණි. | ආයතන දෙකකින් පමණක් මිළ ගණන් එවා තිබුණු අතර, කෘමිනාශක නිසිකලට කප්පු වගාව සඳහා යෙදවියයුතු වූ බැවින්, මිල ගණන් දෙකක් මත කටයුතු කිරීමට සිදුවූ බව හා ඉදිරියේදී ලංසු විවෘත කිරීමේදී කමිටුවේ ගණ පූර්ණය සහභාගී කිරීමට උපදෙස් ලබාදී ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

### 3.6 වාහන අලුත්වැඩියා

----------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 9.3.1 (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙන් බැහැරව රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුවට අයිති වාහන දෙකක් රු. මිලියන 4.85 ක වියදමකින් අලුත්වැඩියා කිරීමට පුද්ගලික ගරාජයකට යොමුකර තිබුණු අතර, ලංසු විවෘත කිරීම ලංසුකරුවන් දැනුවත් කිරීමකින් තොරව කමිටු සාමාජිකයින් දෙදෙනෙකුගේ පමණක් සහභාගීත්වයෙන් සිදුකර තිබුණි. දින 14 ක් තුළ අලුත්වැඩියාව සිදුකරදීමේ එකඟතාවයමත අලුත්වැඩියාවට යොමු කළද වසර 03 කට ආසන්න කාලයක් ගත වී තිබුණද, අලුත්වැඩියාවන් නිමකර නොතිබුණු අතර, මෙම තත්ත්වය අදාළ රථවල ආරක්ෂාවටද තර්ජනයක් වී තිබුණි. තවද, 8.9.1 මාර්ගෝපදේශ ප්‍රකාරව අදාළ ආයතනය සමඟ ගිවිසුම් ගතවීමක්ද සිදුකර නොතිබුණි. | වාහනවල සියයට 90 කට වැඩි ප්‍රමාණයක් අලුත්වැඩියා කටයුතු නිමකර ඇති අතර, මෙම වාහන අදාළ ගරාජයෙන් ලබාගැනීමට මේ වනවිට රේඛීය අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබාගැනීම සඳහා ඇවැසි ඉදිරි කටයුතු සිදුකර ඇති බව හා මින් ඉදිරියට ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබාදී ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළයුතු වීම හා දෙපාර්තමේන්තුවේ වත්කම් ආරක්ෂා කරගැනීමට කටයුතු කළයුතු වීම. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ කැබ් රථයක් රු. 40,180 ක වියදමින් අලුත්වැඩියාවේදී 2.8.1 (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙන් බැහැරව, ප්‍රසම්පාදන සහ තාක්ෂණික ඇගයීම් කමිටුවල සභාපති ලෙස එකම නිලධාරියෙකු කටයුතුකර තිබුණි. | මින් ඉදිරියට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබාදී ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

**3.7 ඉදිකිරීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රම පිරිවැය හැර රු.මිලියන 11.13 ක වියදමකින් කතරගම බලකා මූලස්ථානයේ සෙසු නිල නිවාඩු නිකේතන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර පලාත් පාලන ආයතනයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර, අනුමැතිය ලබාගැනීමෙන් පසුව අනුමැතියකියන් තොරව අවස්ථා කිහිපයකදිම ගොඩනැගිලි සැලැස්ම සංශෝධනය කර තිබුණි. සැලසුම් කළ පරිදි රු. මිලියන 2 ක ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රාදේශීයව සපයාගනු වෙනුවට රජයේ මුදල් වැයකර සපයා ගැනීමට සිදුවී තිබුණු අතර, ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් පරිදි මහජන තරඟයට ඉදිරිපත්කර නොතිබුණි. තවද, ඉදිකිරීමට අදාළ අත්‍යාවශ්‍ය ලේඛන නිසි ලෙස යාවත්කාලීනව ගොනුකර නොතිබුණි ඉංජිනේරුවරයෙකුගේ උපදේශයන් සහ අධීක්ෂණයකින් තොරව පැරණි අත්තිවාරමේ කොටසක් ප්‍රයෝජනයට ගැනීම හා ගොඩනැගිල්ලේ බර දරා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් හා මහපෙන්වීම් ලබා නොගැනීම නිසා ඉදිකිරීම සිදුකරන අතරතුර අඩි 4 ක් උසට බැඳ තිබුණු ගඩොල් බිත්ති කිහිපයක්ම පුපුරා ගෙඩනැගිල්ලෙන් පිටතට ඇලවීමෙන් පසුව එම බිත්ති ඉවත්කර කොන්ක්‍රීට් ටයිබීම් ඉදිකර ඒ මත වෙරගැන්වූ කුලුණුද සමඟ බිත්ති නැවත ඉදිකිරීමට සිදුව තිබුණු අතර, මෙමඟින් විනාශ වූ අමුද්‍රව්‍ය හා ශ්‍රම හානිය ගණනයකර නොතිබුණි. තවද, ගොඩනැගිල්ලේ වැඩකටයුතු අවසන් කිරීමට දීර්ඝ කාලයක් ගත වීමටත් , සියයට සීයකින් පමණ ඉදිකිරීම් පිරිවැය ඉහළ යාමටත් මෙම තත්ත්වය හේතු වී තිබුණි. දොර,ජනෙල් සඳහා වියළි සහ පදම් කළ දැව භාවිතා නොකිරීමත්, නුපුහුණු ශ්‍රමිකයින් යොදවා තනා නිමකිරීමත් නිසා බොහෝ දොර ජනෙල් සුමටව වැසීමට නොහැකි වන ලෙස ඇදවී තිබුණු අතර, දොර ජනෙල් වැසීමෙන් පසුව විශාල හිඩැස් දක්නට ලැබුණි. ඉදිකිරීම් කටයුතු සඳහා භාවිතා කළ ලී පංතිය පිළිබඳව තාක්ෂණ වාර්තාවකින් තහවුරුවක්ද ලබාදී නොතිබුණු අතර, නාන කාමරවල සහ ස්ථාන කිහිපයක බිම් ගඩොල් ඇතිරීම සුමටව සිදු නොකිරීම නිසා ජලය කාන්දුවෙමින් පැවතුණි. | පසුව ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබාගෙන ඇති අතර, මුල් සැලැස්මට සුළු වෙනස්කම් කිහිපයක් සිදුකර ඇති බව හා ප්‍රාදේශීයව සපයා ගතහැකි ද්‍රව්‍ය සපයා ගැනීමට ප්‍රාදේශීය බලධාරීන්ගේ අනුමැතිය නොලැබීමෙන් මිලදී ගැනීමට සිදුවූ අතර, අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් පරිදි කටයුතු කිරීමටත්, ලිපි ගොනු හා ලේඛන නිසි ලෙස පවත්වා ගැනීමටත්, ඉදිරියේදී ගොඩනැගිලි ඉදිකිරීම්වලදී අනුගමනය කළයුතු ක්‍රියාදාමයන් පිළිබඳව උපදෙස් ලබාදී ඇති බව හා බළකාවල ශ්‍රම දායකත්වය මත මෙම දොර ජනෙල් නිමවා තිබූ අතර, ඔවුන් බොහෝමයක් වෘත්තීයමය පුහුණුවක් සඳහා යොමු නොකළ හටයින් හෙයින් මේ තත්වය උදා වී ඇතත්, විගණන නිරීක්ෂණය කර ඇති දොර ජනෙල්වල හා ජලය කාන්දුවන ස්ථාන අඩුපාඩු සකස් කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | පලාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියක් මත ඉදිකිරීම් කටයුතු ආරම්භ කළයුතු අතර, පසුව සිදුකරන වෙනස්කම් සම්බන්ධයෙන්ද අනුමැතිය ලබාගත යුතුවීම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයනට අනුව කටයුතු කළයුතු වීමත්, ඉදිකිරීම් කටයුතු තාක්ෂණික හෝ ඉංජිනේරු නිර්දේශයන් හා මහපෙන්වීම් මත මෙහෙයවියයුතු වීමත්, තාක්ෂණික නිර්දේශයන් මත ගොඩනැගිලි ද්‍රව්‍ය තෝරාගැනීම හා තනා නිමකිරීම කළයුතුවීමත් පිළිබඳව අවධානය යොමුකළ යුතුවීම. |

**3.8 වත්කම් කළමනාකරණය**

**----------------------------**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අවශ්‍යතාවය නිසි ලෙස හඳුනා ගැනීමකින් තොරව එකතුව රු.මිලියන 3.43 ක් වැයකර මිලදී ගත් ටයර්, ටියුබ්, ටෝනර්, නිල ඇඳුම් සහ විදුලි උපකරණද, වටිනාකම හෙළිදරව් නොවූ ටයර්, ටියුබ්, ටෝනර්, විදුලි උපකරණ, නිල ඇඳුම් හා රෙදි සහ එකතුව ඒකක 34,873 ක් ද දීර්ඝ කාලයක් නිකුත් නොවී පැවතීම නිසා ගබඩා තුළම කල්ඉකුත් වී තිබුණු අතර, රු. 165,193 ක් වැයකර මිලදී ගත් විදුලි උපකරණ 17 ක නිදහස් වගකීම් කාලයෙන් අර්ධයකට වැඩි කාලපරිච්ඡේදයක් උපයෝජනය නොකර නිෂ්කාර්යව ගබඩාකර තිබුණි. තවද, 2018 වර්ෂය හෝ ඊට පෙර සිට නිකුත් නොවන හෝ සෙමෙන් නිකුත් වන එකතුව ඒකක 163,568 ක නිල ඇඳුම් වර්ග, රෙදි වර්ග සහ ඒ ආශ්‍රිත ද්‍රව්‍ය පැවති අතර, මෙම තොග ඒකකවලින් තොග ඒකක 130,505 ක වටිනාකම රු.මිලියන 74.05 ක් ලෙස අනාවරණය කර ඇතත්, තොග ඒකක 33,063 ක වටිනාකම විගණනයට අනාවරණය නොකෙරුණි. මෙයින් කළු අත්මේස් 311 ක්, සුදු අත් මේස් 181 ක් හා කළු ලොකු ලේන්සු 159 ක් ප්‍රයෝජනයට ගතනොහැකි වන සේ අවපැහැ ගැන්වී තිබුණි. | මෙම මිලදී ගැනිම් සියල්ලම 2018 වර්ෂයට පෙර මිලදී ගත් විෂයන් වන අතර කුමන කරුණක් නිසා අවශ්‍යතාවයට වඩා මිලදී ගත්තාද සහ තොගයන්ගේ ඉතිරි වූයේද පැහැදිලි නැති බව හා නිලඇඳුම්, ටයර් හා ටියුබ්, ටෝනර්, වැනි විෂයන් සඳහා මණ්ඩල වාර්තා දැනටමත් ලැබී ඇති අතර, එම මණ්ඩල වල නිර්දේශ අනුව කටයුතු කළයුතු බවටත්, අදාළ විදුලි උපකරණ ඉල්ලුම්කරන ලද බලකා වෙත යැවීමට කටයුතු කළයුතු බවටත්, වර්තමානයේ අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතාවයට පමණක් සරිලනසේ භාණ්ඩ මිලදී ගැනීමට ක්‍රියාකළයුතු බවටත් අදාළ අංශ වෙත උපදෙස් ලබාදී ඇති බව. | අවශ්‍යතාවය හා නිකුත් කිරීම් නිසි පරිදි හඳුනාගෙන ප්‍රසම්පාදනයන් කළයුතු වීම. |
| (ආ) | 2019 වර්ෂයේ හෝ ඊට පෙර වර්ෂවල සිට තොග ගබඩාවලින් ඉවත්කරන ලද හෝ පරිහරණයකර භාවිතයෙන් ඉවත්කර දැනට සේරුපිට බලකා මූලස්ථානයේ ගබඩාකර ඇති වර්ග 151 ක විවිධ භාණ්ඩ හා උපකරණ අයිතම 1,228 ක්, ටයර් වර්ග 58 කට අයත් ටයර් 676 ක්, මෝටර් වාහන 17 ක්, ත්‍රීරෝද රථ 05 ක්, යතුරුපැදි 26 ක් හා පාපැදි 05 ක් මෙන්ම කතරගම, උහන ,මහඔය,අම්පාර හා මොනරාගල බලකා මූලස්ථාන ගබඩාවල ඇති අපහරණ භාණ්ඩ වර්ග 305 ක භාණ්ඩ අයිතම 2,554 ක් සමාලෝචිත වර්ෂයේදීද අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණු අතර, මෙම භාණ්ඩ සහ වාහනවල වටිනාකම් විගණනයට හෙළිදරව් නොකෙරුණි. | මෙම සියළුම අයිතම (වාහන හැර) 2021 භාණ්ඩ සමීක්ෂණය අවසානයේදී අපහරණය කිරීමට කටයුතු කරන ලද බව හා වාහන සම්බන්ධව මණ්ඩලයක් පත්කර කටයුතු කරමින් පැවතියද, රටේ පවතින අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් මෙම සියළු කටයුතු මන්දගාමීව සිදුවන බව. | අවශ්‍යතාවය හා නිකුත් කිරීම් නිසි පරිදි හඳුනාගෙන ප්‍රසම්පාදනයන් කළයුතු වීම හා අපහරණ තත්ත්වයේ පවතින වත්කම් කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආරක්ෂක අමාත්‍යාංශයට අයත් වාහන 11 ක් හා යතුරුපැදි 16 ක්, මුදල් අමාත්‍යාංශයකට අයත් වාහන 2 ක්, ජනාධිපති කාර්යාලයට අයත් වාහන 3 ක්, හා පාර්ලිමේන්තු කාර්යාලයට, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට, සංවර්ධන අමාත්‍යාංශයට අයත් වාහනය බැගින් දෙපාර්තමේන්තුව දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් පවතින අතර, මෙම වාහනවල නිත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහන හා යතුරුපැදි පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | අදාළ වාහනවල නිත්‍යානුකූල අයිතිය කඩිනමින් පවරාගත යුතු වීම. |

**3.9 පාඩු හා හානි**

---------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ සිදුවූ එකතුව රු. මිලියන 3.19 ක අලාභ හානි හතරක් සම්බන්ධයෙන් අයකර ගැනීමේ හෝ කපා හැරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි. | මෙකී හානි පිළිබඳ මණ්ඩල පත්කර ඒ සඳහා කඩිනමින් ඉදිරි පියවර ගන්නා ලෙසට උපදෙස් ලබාදී ඇති බව. | අදාළ හානි සම්බන්ධයෙන් අයකර ගැනීමේ හෝ කපා හැරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කළයුතු වීම. |
| (ආ) | මහඔය බලකායේ ගඩොල් නිෂ්පාදන ව්‍යාපෘතියේ ගඩොල් 782,326 ක ඌණතාවයක් නිසා සිදුවී තිබුණු අලාභය වගකිවයුතු නිලධාරීන්ගෙන් පියවා ගැනීමට විමර්ශන මණ්ඩලය විසින් 2018 ජූලි 03 වන දින නිර්දේශ කර තිබුණු නමුත්, අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අදාළ අලාභහානි අය කර ගැනීමට නොපමාව කටයුතු කළයුතු වීම. |

**3.10 කළමනාකරණ දූර්වලතා**

----------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සිවිල් ආරක්ෂක හටයින් 3,300 ක් විදුලි වැට (අලිවැට) නඩත්තු කිරීම සඳහා ද, හටයින් 845 ක් වනඅලි පලවාහැරීම සඳහා ද, හටයින් 389 ක් වනජීවී කාර්යාල කටයුතු සඳහාද ලෙස හටයින් 4,534 ක් අනුයුක්ත කර තිබුණි. ශ්‍රී ලංකාවේ මේ වන විට ඉදිකර ඇති මුළු අලිවැට ප්‍රමාණය කි.මී.4,756 ක් වන අතර, මෙයින් කි.මී. 4,725 ක් හෙවත් සියයට 99 ක් ම සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට නඩත්තු කටයුතු සඳහා භාරදී ඇත. මේ සම්බන්ධයෙන් අදාළ දෙපාර්තමේන්තු දෙක සම්බන්ධීකරණයවන | විදුලිවැට නඩත්තු කටයුතු ආශ්‍රිත අප දෙපාර්තමේන්තුව හා වනජීවී දෙපාර්තමේන්තුව අතර, සම්බන්ධීකරණය වන ආකාරය සම්බන්ධව මේ වනවිට ගිවිසුමක් සකස්කර ඇතත්, එම ගිවිසුම්ගතවීම සඳහා වනජීවී දෙපාර්තමේන්තුව වෙත සිහිකැඳවීම් දෙකක් මඟින් දැනුම් දී ඇති නමුත් | යොදවා ඇති සමස්ත හට පිරිස් හා අලිමිනිස් ගැටුම පාලනය කර ගැනීම සඳහා සමස්ත රජයේ වියදම් සැලකිල්ලට ගත්විට අලි මිනිස් ගැටුමෙන් සිදුවන දේපල හා ජීවිත හානි පාලනයකර ගැනීම සඳහා කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ආකාරය හෝ අනෝන්‍ය සේවාවන් සපයන ආකාරය පිළිබඳවත් මුදල් වෙන්කරන ආකාරය පිළිබඳවත් පොදු එකඟතාවයක් ඇති කරගෙන නොතිබුණි. වනඅලින් පලවාහැරීම සඳහා වාර්ෂිකව රු. මිලියන 427 කට අධික වැටුප් හා දීමනා පිරවැයක් දරා සිවිල් ආරක්ෂක භටයින් 845 දෙනෙකු යොදාවා ගෙන තිබුණු අතර, මෙම භටයින්ට ඒ සම්බන්ධයෙන් විධිමත් පුහුණුවක් ලබාදී නොතිබුණි. තවද, වනඅලින් පලවාහැරීම සඳහා යොදවාගැණුනු භට පිරිස්වල කටයුතු අධීක්ෂණය කිරීමට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරීන් හෝ වනජීවී දෙපාර්තමේන්තු නිලධාරීන් විධිමත්ව පත්කර නොතිබුණු අතර, වනඅලින් පලවා හැරීම සඳහා යථෝක්ත සෙබළුන්හට නිසිපරිදි අවශ්‍ය උපකරණ, ආයුධ සහ අලි වෙඩි ප්‍රමාණවත් පරිදි සපයා නොතිබුණි. 2010 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ශ්‍රී ලංකාවේ අලි වැටවල් ඉදිකිරීම සඳහා දරා ඇති මුළු ප්‍රාග්ධන වියදම රු. බිලියන1.64 ක් වන අතර, 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අලිවැටවල් නඩත්තු කිරීම සඳහා නිලධාරීන්ගේ වැටුප් ඇතුළුව දරා ඇති මුළු වියදම රු. බිලියන 1.16 ක් වී තිබුණි.<br>අදාළ කාලපරාසය තුළ අලිමිනිස් ගැටුම හේතුවෙන් මිනිසුන් 989 දෙනෙකුද, අලි ඇතුන් 3,646 දෙනෙකුද මියගොස් ඇති අතර, පෙර වර්ෂවලට සාපේක්ෂව ආසන්න වර්ෂවල සිදුවූ ජීවිතහානි වැඩි වී තිබුණත්, යොදවා ඇති සිවිල් ආරක්ෂක භටයින්ට මෙම තත්ත්වය පාලනය කරගැනීමට නොහැකි වී තිබුණි. | මේවන තෙක් ඒ සඳහා දිනයක් ලබාදී නොමැති අතර, භටයින් සඳහා විධිමත් පුහුණුවක් ලබාදෙන ලෙසද අප විසින් ඉල්ලීම්කර ඇති බව හා වනඅලින් පළවාහැරීම සඳහා වනජීවී නිලධාරීන්ට සහයදීම පමණක් අප භටපිරිස් ඉටුකරනු ලබන අතර, වර්තමානයේ අලිමිනිස් මරණ අඩුවී ඇති බව වනජීවී දත්ත අනුව පෙනී යන බව. | |
| (ආ) | දෙපාර්තමේන්තුව වෙනත් ආයතන හා පුද්ගලයින්ට අයිති රූඩ් 51 කට අයත් බිම් කැබලි 12 ක් හා වර්ග අඩි 34,286 කට අදාලව ගොඩනැගිලි 42 ක් දීර්ඝ කාලයක සිට පරිහරණය කරන අතර, මෙම ඉඩම් හා ගොඩනැගිලිවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට ප්‍රමාණවත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | වෙනත් ආයතන හා පුද්ගලයින්ට අයත් ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධව ලේඛන පරීක්ෂාකර ඉදිරි කටයුතු සිදුකිරීමට පියවර ගන්නා බව. | වෙනත් ආයතන වලට අයත් ගොඩනැගිලි නඩත්තු කිරීම සඳහා වියදම් දැරිය යුතු නිසා මේවායේ නිත්‍යානුකූල අයිතිය පවරා ගැනිමට කටයුතු කළයුතු වීම. |
| (ඇ) | දෙපාර්තමේන්තුව කාර්යාල පවත්වා ගැනීම, නිල නිවාස හා වාසස්ථාන පහසුකම් හා ගබඩා පහසුකම් සපයා ගැනීම වැනි ගොඩනැගිලි අවශ්‍යතා පිළිබඳව දිගුකාලීන සැලස්මක් අනුව කටයුතු නොකිරීම නිසා දිවයිනේ විවිධ ප්‍රදේශවල විවිධ ආයතන හා පුද්ගලයින්ට අයිති වර්ග අඩි 130,769 ක් හා | මෙම ගොඩනැගිලිවල අවශ්‍යතාවයන් සමාලෝචනයකර ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බව. | ගොඩනැගිලි අවශ්‍යතාවය හඳුනාගෙන දිගු කාලීන සැලැස්මක් මඟින් ගොඩනැගිලි අවශ්‍යතා සම්පූර්ණ කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වර්ග මීටර් 2,000 කට අදාළ ගොඩනැගිලි 128 ක් තාවකාලිකව පරිහරණය කිරීමට සිදුවී තිබුණි. ඇතැම් ගොඩනැගිලි පරිශ්‍ර දෙපාර්තමේන්තු වියදමින් නවීකරණ කටයුතුද සිදුකර තිබුණි. | | |
| (ඇ) | සේවා වනිතා සංගමය විසින් දෙපාර්තමේන්තුවේ සාමාජිකයින්ගේ දරුවන්ට අභ්‍යාස පොත් නිෂ්පාදනය කර බෙදාහැරීම සඳහා කන්තලේ බලකායේ භටයින් 239 දෙනෙකු යොදවාගෙන තිබුණු අතර, මේ වෙනුවෙන් අදාළ භටයින් සඳහා රු.මිලියන 45.1 ක වැටුප් පිරිවැයක් දරා තිබුණු ද, එම මුදල දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය කරවාගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂයන් සඳහා අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීම වෙනුවට විවෘත වෙළඳපලින් මිලදී ගැනීම කෙරෙහි අවධානය යොමුකර ඒ සඳහා කමිටුවක් පත්කර ඇති බව. | අදාල වැටුප් පිරිවැය දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය කර ගැනිමට කටයුතු කළයුතු විම. |
| (ඉ) | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලට සපයනු ලැබූ ආරක්ෂක හා වෙනත් සේවාවන් ඉටුකර දීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු එකතුව රු. මිලියන 18.31 ක හිඟ ආදායම් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. මෙම අයකර ගතයුතු හිඟ ආදායම් වලින් රු. මිලියන 6.38 ක් පසුගිය වර්ෂයේ හිඟහිටි ශේෂවන අතර, මීට වර්ෂ කිහිපයකට පෙර සපයනු ලැබූ සේවාවන් වෙනුවෙන් අයවිය යුතු ශේෂයන් ද පැවතුණි. | දෙපාර්තමේන්තුව මේ වන විටත් සැළකිය යුතු හිඟ ආදායමක් අයකරගෙන ඇති අතර, ඉතිරි හිඟ ආදායම්ද කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | අදාළ හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වීම. |
| (ඊ) | දෙපාර්තමේන්තුවට අයිති බිම් කැබලි 41 කට අදාළ ඉඩම් හෙක්ටයාර 72.05 ක්, වර්ග අඩි 134,955 කට අදාළ ගොඩනැගිලි 118 ක්, මගී වාහන 12 ක්, කෘෂිකාර්මික වාහන 203 ක්, කාර්මික වාහන 19 ක් හා යතුරුපැදි 205 ක්, සමාලෝචිත වර්ෂය අවසන්වන විටද, තක්සේරු කර ස්ථාවර වත්කම් ලේඛනවලට ගෙන මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත්කර නොතිබුණි. | පවරා ගැනීමට හැකියාව ඇති දේපල තක්සේරු කර පවරා ගැනීමටත්, අදාළ තක්සේරු වටිනාකම් 2022 වර්ෂයේ අවසන් ගිණුම්වලට ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලබන බව. | අදාළ වත්කම් ලේඛනගතකර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවීම. |

**4. මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ සිවිල් කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩුවක්, තෘතියික හා ද්විතීක මට්ටමේ පුරප්පාඩු 13 ක් ඇතුළු පුරප්පාඩු 40 ක් ද සෙසු නිල හා භට/භටවරියන්ගේ පුරප්පාඩු 5,296 ක් ද | බඳවා ගැනීම් සඳහා අදාළ අධිකාරීන්ට ලිඛිත ඉල්ලීම් රාශියක් සිදුකර ඇතත් මේ වන තෙක් ඒ සඳහා අනුමැතියක් ලැබී නොමැති අතර, ත්‍රිවිධ හමුදා | පුරප්පාඩු පිරවීමට හෝ තත්‍ය කාර්ය මණ්ඩලයට ගැළපෙන ලෙස අනුමත සේවක සංඛ්‍යාව සමාලෝචනය කර |

| | | |
|---|---|---|
| පැවතුණි. එම පුරප්පාඩු පිරවීමට හෝ තත්‍ය කාර්යමණ්ඩලයට ගැළපෙන ලෙස අනුමත කාර්යමණ්ඩලය සමාලෝචනය කරගැනීමට කටයුතුකර නොතිබුණු අතර, දෙපාර්තමේන්තුවේ 34,866 ක් වූ තත්‍ය කාර්යමණ්ඩලයෙන් සමාලෝචිත වර්ෂයේ කිසියම් හෝ පුහුණුවක් ලබාදී තිබුණේ නිලධාරීන්/සේවකයින් 86 දෙනෙකුට පමණි. | වෙතින්ද සුදුසු නිලධාරීන් අනුයුක්ත කර ගනිමින් දුෂ්කරතා හැකිතාක් දුරකට කළමනාකරණය කර ගැනීමට දෙපාර්තමේන්තුව සමත් වී ඇති බව හා පැවති වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | ගැනීමට කටයුතු කිරීම හා සේවක පුහුණුව තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ නංවාගැනීමට කටයුතු කළයුතු වීම. |